# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1984 අංක 8 දරන
# ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1984 මාර්තු මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1984 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 35 යි　　　　තැපැල් ගාස්තුව : ශත 60 යි.

## 1984 අංක 8 දරන ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1984 මාර්තු මස 06 වන දින.]

එල්. ඩී.—ඕ. 67/83.

**1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1984 අංක 8 දරන ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ:— කෙටි නාමය.

2. 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 381 වන අධිකාරයේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක යෙදීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) යම් මැතිවරණ දිස්ත්‍රික්කයක් සම්බන්ධයෙන් පුරප්පාඩුවක් පිරවීමට මැතිවරණයක් පැවැත්වීමට ආඥා කරමින් දැන්වීමක් පළ කිරීමෙන් පසුව, ජාතික ආරක්ෂාවට හෝ මහජන සාමයට අදාළව පවත්නා තත්ත්ව යන් හේතුකොටගෙන හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට නොහැකි බවට ජනාධිපතිවරයා සෑහීමට පත් වුවහොත් මේ ආඥාවේ වෙනත් යම් විධිවිධානයක පටහැණිව කුමක් සඳහන්ව ඇත ද—

(අ) ඒ මැතිවරණය සඳහා අපේක්ෂකයන් පිළිබඳ නාමයෝජනා කර නොමැති අවස්ථාවක, ඒ මැතිවරණය පැවැත්වීමට ආඥා කරන දැන්වීමෙහි නිශ්චය කොට දක්වනු ලැබූ නාම යෝජනා කිරීමේ දිනය, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් කල් දමනු ලැබිය හැකි ය ; තව ද ඒ ආඥාව මගින් හෝ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තදනන්තර ආඥාවක් මගින් හෝ ඒ මැතිවරණය සඳහා වෙනත් නාමයෝජනා කිරීමේ දිනයක් නියම කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(ආ) ඒ මැතිවරණය සඳහා ඡන්ද විමසීමේ දිනයක් නිශ්චය කොට දක්වමින් 35 (3) වන වගන්තිය යටතේ දැන්වීමක් පළ කරනු ලැබ ඇති අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් ඡන්ද විමසීමේ දිනය කල් දමනු ලැබිය හැකි ය. තව ද, ඒ ආඥාව මගින්

ඒ 074668—7,975 (84/01)

හෝ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තදනන්තර ආඥාවක් මගින් හෝ ඒ ඡන්ද විමසීම සඳහා වෙනත් දිනයක් නියම කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, ඒ මැතිවරණය පැවැත්වීමට ආඥා කෙරෙන දැන්වීමෙහි නිශ්චය කොට දක්වනු ලැබූ නාමයෝජනා කිරීමේ දිනයේ සිට ගණන් බලනු ලැබූ විට මාස දොළහකට පසුව ඇති දිනයකට ඒ මැතිවරණය සඳහා ඡන්ද විමසීමේ දිනය කල් දැමීම (අ) ඡේදය යටතේ හෝ (ආ) ඡේදය යටතේ හෝ කරන ලද කිසිම ආඥාවකින් සිදු නොවිය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.